
# පශ්චාත් කොවිඩ් යුගයේ රට මෙහෙයවීමට ශක්තිමත් විධායකයක් ඕනෑ

**පශ්චාත් කොවිඩ් යුගයේදී එල්ලවිය හැකි සමාජ, ආර්ථික හා ජාත්‍යන්තර අභියෝගවලට ඉක්මන් විසඳුම් අවශ්‍ය වනු ඇති අතර ඉක්මනින් එලදායී තද තීරණ ගැනීමට ශක්තිමත් විධායකයක් රටට අවශ්‍ය බව පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. කොවිඩ්-19 වසංගතය පැතිරුණ වකවානුවේ ඉක්මනින් තීරණ ගෙන පාලනය කළ හැකි වූ හා සමානව ක්‍රියා කිරීම අවශ්‍ය අතර ප්‍රධාන දේශපාලන පක්ෂ ඉදිරියේදී අනුගමනය කරන ව්‍යූහය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල පැහැදිලි ස්ථාවරයක් ඉදිරිපත් කර නැති බවද කියා සිටී. මනාප ක්‍රමය අහෝසි කර ආසන මටට්ම නැවත ඇති කළ යුතු අතර පළාත් සභා පලක් නැති බවද මෙහි දැක්වෙයි.**



දහ නමවැනි ව්‍යවස්ථා සංශෝධනය අනුව, විධායකය හා ව්‍යවස්ථාදායකය අතර බලය සම්බන්ධයෙන් පවතින දුර්වලතා හේතුවෙන් ක්‍රියාකාරීත්වය අඩාල විය හැකිය. සමහර අංශ අක්‍රිය විය හැකි බව ද මොරගොඩ මහතා පෙන්වා දෙයි. පාර්ලිමේන්තුවට වගකියන ශක්තිමත් විධායක ජනාධිපති ධුරයක් ඇති කරන ව්‍යවස්ථා සංශෝධනයක් ගැන කල්පනා කළ යුතුය. කන්කසන්තුරයේ සිට දෙව්නුවර දක්වා පුරවැසියන් ගේ ඡන්දයෙන් බලයට පත් වන සහ සමස්ථ ජනතාවට වගකියන එකම පුද්ගලයා බවට පත්වන බවද හෙතෙම අවධාරණය කරයි.

ව්‍යවස්ථා සංශෝධනයේදී බලතුලනය ගැන අවධානය යොමුකළ යුතු අතර, පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයන් තෝරා ගැනීමේදී වැඩි කොටසක් කෙලින්ම ජනතාව පත්කරන ආසන මට්ටමට යා යුතුය. අවශ්‍ය නම් සුළු කොටසක් සමානුපාතික ක්‍රමයකට විය හැකිය. කෙසේ වෙතත් මනාප ක්‍රමය සහමුලින්ම අහෝසි කළ යුතු බවද මිලින්ද මොරගොඩ මහතා කියා සිටී. පළාත් සභා ක්‍රමය අවශ්‍ය නැති අතර ජනතාවගේ එදිනෙදා ගැටලු විසඳන පළාත් පාලන ආයතන ව්‍යුහය ශක්තිමක් කළ හැකිය. සුළු ජන කොටස් හා ප්‍රාදේශීය නියෝජනය සලකා සෙනෙට් මණ්ඩලයක් පත්කළ හැකි බවද මෙම නිවේදනයෙහි දැක්වෙයි.

විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දී වසර හතළිස් දෙකක් ගත වී ඇති අතර එය අහෝසි කරන බවට ගෙන යන විවාදය අසමත් වී ඇත. 2015 වසරේදී ලැබුණ අවස්ථාවේ දී පවා අහෝසි කරන පියවර ගත්තේ නැත. උදා වී ඇති කාලපරිච්ඡේදය නිදහසට පසු රටට මුහුණ දෙන්නට සිදුවී ඇති බරපතලම අභියෝග සහිත වකවානුවකි. විධායක බලයකින් හැර, මෙම මොහොතේදී රටට ගැලවීමක් නැති බව ද මෙහි සඳහන්ය. බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබූ ඇමරිකාව ශක්තිමත් විධායකයෙකු සහිත ජනාධිපති ධුරයක් ඇති කළේය. එය නිර්මාණය කිරීමේදී තිබුණ විවාදයේදී, දුර්වල විධායක ධුරයකින් දුර්වල ආණ්ඩු හැදෙන සහ දුර්වල ආණ්ඩුවකින් රාජ්‍ය පාලනය අසාර්ථක වන අතර දුක්විඳින්නේ ජනතාව බව අවධාරණය වූ බව මතක් කරදෙන මිලින්ද මොරගොඩ මහතා අද අපට අවශ්‍ය ජනතාවගේ උවමනා එපාකම් සාක්ෂාත් කළ හැකි ශක්තිමත් ආණ්ඩුවක් බවද අවධාරණය කරයි.